ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 3 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2006/2007

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය I - LWU 1201



කාලය - පැය තුනයි.

---

දිනය -2007.03.05 වේලාව - පෙ.ව.10.00 -ප.ව.01.00 දක්වා

---

*අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.*

*<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.</u>*

01. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථා ඉතිහාසය විග්‍රහ කරන විට කෝල්බෲක් කොමිසමෙන්, මැකලම් ප්‍රතිසංස්කරණවලින්, මැනිං ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්, ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහ සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබාදෙන ලද දායකත්වයන් නොසලකා හැරිය හැකි නොවේ. ඒවායේ දායකත්වයන් පසුව සකස් කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් තුළ නිරූපණය වනු දැකිය හැකි වේ.

    ශ්‍රී ලංකාවේ 1972 සහ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් ඇසුරින් ඉහත සඳහන් ප්‍රකාශය විශ්ලේෂණාත්මකව විග්‍රහ කරන්න.

02. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය පිළිබඳ ඕනෑම අධ්‍යයනයක් රාජ්‍යය සහ රජය යන සංකල්පයන් වෙත යොමුවේ. රාජ්‍යය ඒකීය හෝ සන්ධීය විය හැකි වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සංශෝධනය කරනු ලබන ඒ එක් එක් ක්‍රමවේදයේ වෙනස මඟින් අදාල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනම්‍ය හෝ නම්‍ය බවට පත් කරයි.

    සාකච්ඡා කරන්න.

03. අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගත විධිවිධානයන්හි ප්‍රතිඵලදායකභාවය පිළිබඳ විශ්ලේෂණාත්මක විග්‍රහයක් කරන්න.

04. "බලතල බෙදාහැර හෝ බෙදාහදාගෙන ඇත්නම් එය ප්‍රතිඵලදායක ලෙස ක්‍රියාවේ යෙදවිය හැකි වේ."

එක්සත් රාජධානිය, ඇමරිකා එක්සත් ජනපදය සහ ශ්‍රී ලංකාවේ අත්දැකීම් කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය විග්‍රහ කරන්න.

05. රාජ්‍යයක පදනම් ව්‍යුහය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව එහි ජනතාවගේ අවශ්‍යතාවයන්හි වෙනස්වීම් අනුව සකසාගත හැකි විය යුතු වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සංශෝධනය කිරීම පහසු කටයුත්තක් නොවේ. ශ්‍රී ලංකා සංදර්භය තුළ සංශෝධන ක්‍රියාවලිය වෙනස් කළයුතු ව්‍යවස්ථාව අනුව වෙනස් වේ. කෙසේ වෙතත්, ව්‍යවස්ථා සංශෝධනයක් ප්‍රකාශිතව හෝ ව්‍යංගයෙන් කළ හැකිය.

අදහස් දක්වන්න.

06. නීතියේ බලය යනු විවිධ යුගවලදී විවිධ ආකාරයෙන් අර්ථනිරූපණය වූ පැරණි සංකල්පයක් වේ. නමුත් එය අද දිනයේද අදාල වෙමින් පවතී.

අන්තර්ජාතික නීතිවේදීන්ගේ සමුළුව මගින් නීතියේ බලය අද දවසේදී වඩා කාර්යක්ෂම හා වලංගු සංකල්පයක් බවට පත් කිරීම සඳහා ගන්නා ලද උත්සාහයන් සැලකිල්ලට ගනිමින් ඉහත ප්‍රකාශය විශ්ලේෂණය කරන්න.

07. "වර්තමාන අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ විධායක ජනාධිපතිධූරය මගින් රාජ්‍යයේ සෑම ආයතනයක් වෙතම ගැඹුරු හා පැතිරුණු බලපෑමක් කර ඇත."

ඉහත ප්‍රකාශයේ නිවැරදිභාවය පිළිබඳ විශ්ලේෂණය කරන්න.

08. ශ්‍රී ලංකාවේ 1972 සහ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් යටතේ ජාතික රාජ්‍ය සභාවේ හා පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක ආධිපත්‍ය පිළිබඳ විග්‍රහයක් කරන්න.

- හිමිකම ඇවිරිණි. -